පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

**තෙවන වාර පරීක්ෂණය - 2023**

**12 ශ්‍රේණිය**

**නාට්‍ය හා රංග කලාව - සිංහල II**

| 57 | S | II |
|---|---|---|

විභාග අංකය : ........................................

කාලය: පැය 03 යි
අමතර කියවීම් කාලය - මි. 10 යි

1 කොටස

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලියන්න.
* ඉතාම නිවැරදි හෝ ගැළපන පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

1. කලාව යන සංකල්පය නිවැරදිව අර්ථකතනය වී ඇති පිළිතුර වන්නේ,
   (1) පුද්ගලයා වින්දනයට පත් කිරීමයි.
   (2) සොබා දහමේ අපූර්වත්වය විදහා දක්වන දර්ශනයයි.
   (3) රසිකයා පිනවනු ලබන අපූර්වත්වයකින් යුත් සෞන්දර්යාත්මක නිර්මාණයයි.
   (4) පුද්ගලයා තම සිතුවිලි ක්‍රියාවට නැංවීමයි.
   (5) පුද්ගලයා ප්‍රඥාව කරා ගෙන යන සංකල්පයයි.
2. වාචික අභිනය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
   (1) වාචික අභිනයට අයත් වන්නේ සංවාද පමණකි.
   (2) නාට්‍ය ධර්මී සම්ප්‍රදායේ දර්ශන පසුතල ආදිය මවා පාන්නේ වාචික අභිනයෙනි.
   (3) වාචික අභිනයෙන් තොර ප්‍රාසාංගික කලාවක් පැවතිය නොහැක.
   (4) වාචික අභිනය උච්චාරණය කෙරෙන ඉඟි නාට්‍ය පිටපතෙහි සඳහන් නොවේ.
   (5) ලෝක ධර්මී සම්ප්‍රදායේ වාචික අභිනයට වැදගත් තැනක් හිමි නොවේ.
3. රුකඩ ගෙදර නාට්‍යයේ එන දෙවන අංකය ආරම්භයේ දක්නට ඇත ප්‍රධාන සිදුවීමක් නොවන්නේ,
   (1) තරන්තලා නර්තනයට අඳින ඇඳුමේ ඉරුණු තැන් මැසීම.
   (2) නෝරාගේ නිවසට ලින්ඩේ මිය පැමිණීම.
   (3) නිවසේ ප්‍රීතිමත් පරිසරය වියැකී යාම.
   (4) නෝරා නත්තල් ගස හා තෑගි රැගෙන නිවසට පැමිණීම.
   (5) හෙල්මට නර්තන පුහුණුවීම් සඳහා ආයාචනා කිරීම.
4. සකල ජන නම් නාට්‍ය අයත් වන නාට්‍ය ප්‍රභේදය වන්නේ,
   (1) ප්‍රාතිහාර්ය නාට්‍ය
   (2) චක්‍ර නාට්‍ය
   (3) මිරකල් නාට්‍ය
   (4) මිස්ටරි නාට්‍ය
   (5) සදාචාර නාට්‍ය
5. ග්‍රීක නාට්‍ය කලාවට තෙවන නළුවෙකු එක් කරනු ලැබුවේ,
   (1) ඇරිස්ටොෆනීස්
   (2) ඊස්කිලස්
   (3) යුරිපිඩීස්
   (4) සොෆොක්ලීස්
   (5) මිනැන්ඩර්
6. ඩිතිරැම්බ ගායනා කලාත්මක අගයකින් යුක්තව සකස් කලේ,
   (1) සොෆොක්ලීස්
   (2) අරියෝන්
   (3) ඇරිස්ටෝටල්
   (4) දියොනිසස්
   (5) තෙස්පීස්
7. රුකඩ ගෙදර නාට්‍ය අයත්වන රංග රීතිය වන්නේ
   (1) රොමැන්ටික්
   (2) අභූතරූපී
   (3) අඛ්‍යාන
   (4) ස්වභාවිකවාදී
   (5) යථාර්තවාදී
8. නාට්‍ය යේ ප්‍රේක්ෂාව මැවීම සඳහා අදාළ නොවන පිළිතුර වන්නේ

(1) නිර්මාණ පසුතල
(2) වේදකා පරිපාලනය
(3) වේදිකා ආලෝකකරණය
(4) රංග වස්ත්‍රාභරණ
(5) නාට්‍ය උපකරණ

9. පල්ලියෙන් පිටත පෙන්වනු ලැබූ මිස්ටරි නාට්‍ය තුල යොදා ගත් කතා පුවතක් වන්නේ,
(1) අන්තිම  රාත්‍රී භෝජනය.
(2) ජේසු උපත දේව දූතයා විසින් එඬේරුන්ට දැනුම් දීම.
(3) ජේසු උපත බැහැදැකීමට ආ රජ තුන් කට්ටුව.
(4) ශාන්ත නිකලස් තුමාගේ කතාව.
(5) ක්‍රිස්තු තුමාගේ උත්ථානය නිරූපණය කිරීම.

10. ඊස්කිලස් විසින් රචනා කරන ලද ප්‍රථම නාට්‍ය කෘතිය වන්නේ,
(1) තීබයට එරෙහි වූ සත් දෙනා
(2) පර්සියන්වරු
(3) ඇගමෙම්නොන්
(4) ප්‍රොමිතියස් බන්ධන
(5) යදින්නෝ

✱ 11-15 දක්වා දී ඇති තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.

A. රබාන
B. නෝආ සහ නැව
C. නත්තල් ගස
D. මෙකීස්
E. කළුකුරුසය
F. කුතුර්නෝස්
G. එව්රි මැන්
H. ඔන්කෝස්

11. ග්‍රීක රංගය හා සම්බන්ධ අංග ඇතුළත් අක්ෂරය වන්නේ,
(1) ADF
(2) ABG
(3) DFH
(4) DEF
(5) CFH

12. යථාර්ථවාදී නාට්‍යක තේමාවට සම්බන්ධව සංකේතාත්මකව යොදාගත් රංග භාණ්ඩ දෙකකි,
(1) AC
(2) CE
(3) EH
(4) CD
(5) DE

13. මධ්‍යකාලීන යුරෝපීය ජන වන්දනා නාට්‍ය හා සම්බන්ධ අංග වනුයේ
(1) AEH
(2) BDF
(3) BCH
(4) ABG
(5) ACF

14. යථාර්ථවාදී නාට්‍යක දක්නට ලැබෙනා අංග වනුයේ;
(1) ACH
(2) ACE
(3) BDE
(4) BCF
(5) DEF

15. මධ්‍යකාලීන යුරෝපීය නාට්‍ය කලාවට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) නළු නිළියන් සඳහා සහභාගී වූයේ පූජකවරුන් පමණි.
(2) කිසිදු මධ්‍යකාලීන නාට්‍යයක් අනුවර්තනයක් හෝ පරිවර්තනයක් ලෙසින් සිංහල බසට නැගී නැත.
(3) මධ්‍යකාලීන යුරෝපයේ සියළු නාට්‍ය පල්ලිය තුළ පමණක් රඟ දැක්විණි.
(4) “ද මිස්ටරි ඔෆ් ඇඩම් “පැරණිතම මිස්ටරි ( අද්භූත ) නාටකය ලෙස සැළකේ.
(5) ඉංග්‍රීසි චක්‍රනාටක සඳහා බයිබල් කතා පුවත් පදනම් වූයේ නැත.

16. ග්‍රීක නාට්‍ය සම්ප්‍රදායේ ,
(1) ශෝකාත්මක නාට්‍යයක අධ්‍යක්ෂකවරයා හැඳින්වූයේ කොරිගෝස් නමිනි.
(2) සියළුම ග්‍රීක නාට්‍ය ගද්‍යයෙන් රචනා වී ඇත.
(3) ග්‍රීක ශෝකාන්ත නාට්‍ය බොහෝමයක් රචනා වී ඇත්තේ පශ්චාත් දෘෂ්ටිමය කථන ක්‍රමයටය.
(4) පෞර දියෝනීසියා උළෙලට සටුර නාටක ඉදිරිපත් නොවුණි.
(5) ග්‍රීක ශෝකාත්ම නාට්‍ය වලට අදාළ භාව අටක් පිළිබඳ ඇරිස්ටෝටල් පෙන්වා දී ඇත.

17. .ග්‍රීක ට්‍රැජඩියේ කතා නායකයා හෝ ප්‍රධාන චරිතය,
   (1) නිරන්තරයෙන්ම හාස්‍යයට ලක් වේ.
   (2) සෑම විටම දෛවය නිසා හෝ තමාගේ වරදින් දුකට පත් වේ.
   (3) සෑම විටම තම අභිප්‍රායන් ඉටුකර ගනී.
   (4) නිරතුරුවම හාස්‍ය මතු කරනා විකට සංවාදයේ යෙදේ.
   (5) නාට්‍ය පුරාම විකට චරිතයකි.
18. කාව්‍ය ශාස්ත්‍රයේ පරිච්ඡේද ගණන වන්නේ,
   (1) 16කි  (3) 10කි  (5) 26කි
   (2) 36කි  (4) 6කි
19. සැටර් නාට්‍ය තුළින් දැනට සම්පූර්ණයෙන්ම ඉතිරි වී ඇති නාට්‍ය වන්නේ,
   (1) සොෆොක්ලීස්ගේ ඉක්නෙව්ටායි
   (2) යුරිපිඩීස්ගේ කුක්ලෝපස්
   (3) ඇරිස්ටොෆනීස්ගේ වළාකුළු
   (4) ඊසකිලස්ගේ යදින්නෝ
   (5) යුරිපිඩීස්ගේ මීඩියා

✱ 20 – 22 දක්වා දී ඇති වරණ අතරින් එක් වර්ණයක් අනෙක් වර්ණ හා නොගැළපේ නොගැළපෙන වර්ණය තෝරන්න.

20. (1) මේකීස්  (2)පැරඩෝස්  (3)ඔන්කෝස්  (4)ස්කීනිය  (5) පැරික්සීනියා

21. (1)ඊඩිපස්  (2) ඇන්ටිගනී  (3)ඉලෙක්ට්‍රා  (4)ඇජැක්ස්  (5)වළාකුළු

22. (1)ලින්ඩේ  (2)ජොකෙස්ට්‍රා  (3)හෙල්මර්  (4)නෝරා  (5)කොග්ස්ටඩ්

23. නාට්‍යක ප්‍රේක්ෂාව සම්බන්ධව පහත දැක්වෙන ප්‍රකාශ අතරින්ඇරිසේටෝටල්ගේ අර්ථකතනය තෝරන්න.

   (1) නාට්‍යෝපකරණ හා අංග රචනයයි.
   (2) පසුතල නිර්මාණ හා ආලෝකයයි.
   (3) වේදිකාවේ මැවෙන දෘෂ්ටි ගෝචර බවයි.
   (4) වේෂභූෂණ හේතුවෙන්ප්‍රේක්ෂකයා අභිමුඛයේ මැවෙන දර්ශනයයි.
   (5) රංග භූමිය මත මොහොතින් මොහොත මැවෙනා රූපයයි.
24. ඇරිස්ටෝටල්ගේ ප්‍රකාශ අනුව නාට්‍ය යනු,
   (1) උත්තුංග ක්‍රියාවක අණුකරණයකි.
   (2) ජීවිතයේ පැතිකඩයි.
   (3) අවස්ථා අණුකරණයයි.
   (4) ලෝකයේ සුඛ දුක්ඛයන දෙකෙන්ම යුක්ත වූ යම් ස්වභාවයක් පවතීද එය අංග ආදී අභිනයෙන් ප්‍රකාශ කිරීමයි.
   (5) ජීවිතයේ පිටපතකි, සිරිත් විරිත් වල කැටපතකි.
25. ග්‍රීක නාට්‍යයේ කැතාසීස්කරණය යනු,
   (1) නළුවන් විසින් අත්දකින තත්වයකි.
   (2) ආකුලීකරණය හා අනාවරණය නිසා ඇතිවන තත්වයකි.

(3) භය හා කාරුණ්‍ය මස්තක ප්‍රාප්ත වී එය නිදහස් කර ගැනීමෙන් ඇති වන සහනශීලී තත්වයකි.
(4) එක දිගට වූ ට්‍රැජඩි තුනක් නැරඹීමෙන්ඇතිවන මානසික ආතතියයි.
(5) භය හා දුක ඉහවහ යාමෙන් ඇතිවන තත්වයයි.

26. ග්‍රීක නාට්‍ය කලාවේ 'කොරිගෝස්' යනු
(1) නාට්‍ය රචකයා
(2) අධ්‍යක්ෂකවරයා
(3) නාට්‍යයේ ප්‍රධාන චරිතය රගපාන නළුවා
(4) නාට්‍ය නිෂ්පාදකවරයා
(5) නාට්‍ය සඳහා මුදල් යොදවන පුද්ගලයා

27. ''නාට්‍යකරුවා සමාජයෙහි ගුරුවරයාය.'' යන ග්‍රීක සංකල්පය දැඩි ලෙස පිළිගත් විප්ලවීය චින්තකයකු වූ ග්‍රීක නාටයකරුවා වන්නේ,
(1) යුරිපිඩීස්
(2) ඊස්කිලස්
(3) සොෆොක්ලීස්
(4) ඇරිස්ටොෆනීස්
(5) තෙස්පීස්

28. පල්ලියෙන් පිටත චක්‍ර නාට්‍යවලදී රඟ දක්වන ලද මිස්ටරි කතා පුවතක් වන්නේ,
(1) සාන්ත ඇපලෝගේ කතාව
(2) රජ තුන් කට්ටුවේ කතාව
(3) දෙවන එඬේරාගේ කතාව
(4) සාන්ත ඇග්නස් තුමියගේ කතාව
(5) ජේසු උපත දේව දූතයා විසින් එඬෙරුන්ට දැනුම් දීම.

29. ක්‍රි.ව. 311 දී රෝම නාට්‍ය කලාව තහනම් කරනු ලැබුවේ,
(1) ටර්ටූලියන් නම් සභා පිතෘවරයා විසිනි.
(2) ප්ලේටෝ නම් දාර්ශනිකයා විසිනි.
(3) ඇරිස්ටෝටල් විසිනි.
(4) කොන්ස්ටන්ටයින් අධිරාජයා විසිනි.
(5) සොෆොක්ලීස් නම් නාට්‍යකරු විසිනි.

30. සොෆොක්ලීස් නම් නාට්‍යකරුවා පිළිබඳව දක්වා ඇති ජීවන තොරතුරු අතරින් සාවද්‍ය තොරතුර වන්නේ,
(1) ක්‍රි.පූ.497406 දී කොලෝනස් පෙදෙසෙහි උපත ලබා ඇත.
(2) ග්‍රීසියේ විසූ විතණ්ඩවාදීන්ගේ දාර්ශනික මත වලට නැඹුරු වූ අයෙකි.
(3) අවුරුදු 15 දී සංගීත කණ්ඩායමක් මෙහෙයවා ඇත.
(4) ක්‍රි .පූ. 468 දී අනූවසරක් ආයු වළඳා මිය ගියේය.
(5) චමත්කාරජනක කවියෙකු වූ මොහු ශෝකාන්ත නාට්‍ය ඉහළ තලයට නැංවූ රචකයාය.

✱ 31 – 35 දක්වා ප්‍රශ්න වල නොගැළපෙන පිළිතුර තෝරන්න.

31. ග්‍රීක කොමඩි නාට්‍යයකි,
(1) අකර්ණියයෝ
(2) ඇජැක්ස්
(3) සිටුවරු
(4) වළාකුළු
(5) කුරුල්ලෝ


32. ග්‍රීක නාට්‍ය රංග ශෛලිය තුළ දක්නට ලැබෙනා ලක්ෂණයක් වන්නේ,
(1) රංගනයේ යෙදෙන නළුවන් ජීව ප්‍රමාණයට වඩා විශාල කිරීම.
(2) නාට්‍ය දර්ශන දිවා කාලය තුළ ප්‍රදර්ශනය.
(3) මුහුණේ ප්‍රමාණයට වඩා විශාල වෙස් මුහුණු භාවිතය.
(4) නළුවාගේ සාත්වික අභිනයට ප්‍රධාන ස්ථානයක් ලැබීම.
(5) ගායන වෘන්දය නාට්‍ය තුළ විශේෂ කාර්යය භාරයක් ඉටු කිරීම.

33. කොමඩි නාට්‍ය කෘතියක් තුළ දක්නට ලැබෙනා ලක්ෂණයකි,
(1) ප්‍රධාන පරමාර්ථය විනෝදය වීම.
(2) සාමාන්‍ය පුද්ගල චරිත කතා වස්තුව තුළ යොදා ගැනීම.
(3) සමාජයේ දුර්වල තැන් මෙන්ම දේශපාලන නායකයින් විවේචනය කිරීම.
(4) බහුල වශයෙන් කාලීන මාතෘකා පාදක කර ගැනීම.
(5) නාට්‍ය තුළ ආගමික අදහස් ගැබ් වීම හා අනාවැකි වස්තු කොට ගැනීම.

34. යුරිපිඩීස් නම් නාට්‍යකරුවාගේ නාට්‍ය නිර්මණයකි.
(1) මීඩියා
(2) ඉලෙක්ට්‍රා
(3) හිපොලිටස්
(4) ද ට්‍රෝජන් විමෙන්
(5) අල්කීස්ටික්

35. කාව්‍ය ශාස්ත්‍රයේ සඳහන් නාට්‍ය ප්‍රභේදයකි.
(1) සුඛාත්ම
(2) දෘශ්‍ය කාව්‍ය
(3) සටුර
(4) වීර කාව්‍ය
(5) ශෝකාත්ම

✱ 36 – 40 දක්වා දී ඇති රූප සටහන ඇසුරෙන් පිළිතුරු සපයන්න.




1



11

36. ඉහත 1 ඡායාරූපයෙන් දැක්වෙන රංග භූමියේ A අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) ප්‍රේක්ෂාලය
(2) ස්කිනිය
(3) පැරිස්කීනියා
(4) පැරඩෝස්
(5) තිම්ලිය

37. B අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) අල්තාරය
(2) පැරඩෝස්
(3) ස්කිනිය
(4) පැරිස්කීනියා
(5) තිම්ලිය

38. C අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) පැරඩෝස්
(2) ස්කිනිය
(3) ප්‍රේක්ෂාලය
(4) පැරිස්කීනියා
(5) අල්තාරය

39. D අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) ස්කිනිය
(2) ප්‍රේක්ෂාලය
(3) පැරඩෝස්
(4) පැරිස්කීනියා
(5) ඕකෙස්ට්‍රා

40. ඉහත 11 ඡායාරූපයේ දැක්වෙන නාට්‍යකරුවා වන්නේ,
(1) බර්ටෝල්ඩ් බ්‍රෙෂ්ට්
(2) හෙන්රික් ඉබ්සන්

(3) ඇරිස්ටෝටල්
(4) සොෆොක්ලීස්
(5) ස්ටැනිස් ලාවුස්කි

## 11 කොටස

✱ A හා B කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.

## A කොටස

1)

1) මධ්‍යකාලීන යුරෝපයේ ඇති වූ ජන වන්දනා නාට්‍ය ආරම්භයට හේතු වූ පසුබිම කෙටියෙන් හඳුන්වන්න.
2) ජන වන්දනා නාට්‍ය ප්‍රභේද කීයද? ඒවා නම් කරන්න.
3) ඉහත එක් නාට්‍ය ප්‍රභේදයක් පිළිබඳව සැකවින් පහදන්න.

2)

1) ග්‍රීක නාට්‍යකරුවන් සිව් දෙනෙකු නම් කරන්න.
2) ඉහත නාට්‍යකරුවන්ගේ නාට්‍ය නිර්මාණ දෙක බැගින් ලියන්න.
3) ඔබ ලියන ලද එක් නාට්‍යකරුවෙකුගේ නිර්මාණ පිළිබඳව විස්තර කරන්න.

3)

1) නාට්‍ය විචාරකයෙකු තුළ තිබිය යුතු ලක්ෂණ හතරක් ලියන්න.
2) නාට්‍ය නැරඹීමට එන ප්‍රේක්ෂකයා තුළ තිබිය හැකි විවිධ අරමුණු හතරක් ලියන්න.
3) ප්‍රේක්ෂක ප්‍රතිචාර මඟින් නාට්‍ය නිෂ්දකවරයාට ලැබෙන ප්‍රතිලාභ විග්‍රහ කරන්න.

## B කොටස

4)

1) රුකඩ ගෙදර නාට්‍ය ආරම්භයේ වේදිකාව තුළ දක්නට ලැබෙනා රංග භාණ්ඩ හතරක් ලියන්න.
2) යථාර්තවාදී නාට්‍ය කලාවේ ලක්ෂණ දෙකක් රුකඩ ගෙදර නාට්‍ය ඇසුරෙන් පහදන්න.
3) නුවුරා හා ටෝවල්ඩ්ගේ චරිතවල ඔබ දකින ජීවන අරමුණු හා චරිත ලක්ෂණ නාට්‍ය ඇසුරෙන් උදාහරණ දෙමින් පහදන්න.

5)

1) ඇරිස්ටෝටල් පෙන්වා දී ඇති ප්‍රත්‍යාවර්ථනය හා ප්‍රත්‍යාභිඥානය ඊඩිපස් නාට්‍ය ඇසුරෙන් කෙටියෙන් පහදන්න.
2) මානවයා තුළ දක්නට ලැබෙනා ගුණ ධර්ම හා දුර්වලතා ඊඩිපස් නාට්‍යයේ ඊඩිපස් චරිතය ඇසුරෙන් විමසීමට ලක් කරන්න.
3) ඊඩිපස් නාට්‍ය පෙළෙන් මතුවන ජීවන දෘෂ්ටිය සැකෙවින් විමසන්න.

6)

1) කාව්‍ය ශාස්ත්‍රයේ සඳහන් වන පරිදි ට්‍රැජඩි නායකයාගේ ලක්ෂණ දෙකක් ලියන්න.
2) ග්‍රීක රංග ශෛලියේ භාවිතය ඊඩිපස් රජ නාට්‍ය ඇසුරෙන් විමසන්න.
3) ග්‍රීක නාට්‍ය තුළ දක්නට ලැබෙනා ත්‍රිවිධ ඒකීයත්වය ඊඩිපස් පෙළ ඇසුරින් විමසන්න.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

**තෙවන වාර පරීක්ෂණය - 2023**

**12 ශ්‍රේණිය** **නාට්‍ය හා රංග කලාව - සිංහල I**

| 57 | S | II |
|---|---|---|

විභාග අංකය : ........................................

කාලය: පැය 03 යි
අමතර කියවීම් කාලය - මි. 10 යි

✱ සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
✱ වඩාත් නිවැරදි හෝ ගැළපෙන පිළිතුර වරහන් තුළ යොදන්න.

- පහත දී ඇති ගීත ඛණ්ඩ ඇසුරෙන් අංක 01 – 05 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

A. නෙතින් නෙත සොළවයි
නෙතින් නෙත තල සොළවයි
ලෝක බිය කරවයි
නටා මරුවා මෙරග එනවයි

B. පණිවිඩ කරවනා - ලෙසට සබයට එමිනා
බස්තමක් රැගෙනා - එන්න සැරසී සබයේ සිටිනා

C. නොහඩනු කුමරුනි - ඇවිළ ලසෝ ගිනි
එන රජ කුමරිය - ඈත එතෙර සිට
ඔබ සනහාලයි- දුකදුර දුරු කොට

D. තෙමාලා රෙද්ද නැළියේ ඔබනකොට
රවාලා පැනපි මහ ඉණිකුණා ගෙට
අඩාලා පැනපි කොල්ලෝ දොර පිළට
කපාලා දෙමිය කොටඹේ වීරයට

E. උත්මවන් ලොව පතලා - එංගලන්ත නමින් යුතු විපුලා
තුංග සිරින් රන්දු සකලා - දේස ලන්ඩන් පුරවර නිමලා

F. නැදුන් කොටන්නේ කාගේ වියක්දෝ
නොකෙටී තියෙන්නේ මහ මෙර ගලක්දෝ
නොපිපි තියෙන්නේ මහනෙල් මලක්දෝ
නැදුන් ගේන්නේ කාගේ බසක්දෝ

1. උඩරට ශාන්තිකර්මයක් හා බැදි ගීත ඛණ්ඩ වන්නේ,
   1. A හා D
   2. D හා F
   3. A හා F
   4. B හා D
   5. B හා F

2. ඓතිහාසික කතාවක් පාදක කොටගෙන ප්‍රධාන පෙළේ නාට්‍යක දක්නට ලැබෙනා ගීත ඛණ්ඩයකි,
    1. A 2. C 3. D 4. E 5. F

3. පහතරට ගැමිනාටකයක හා ශාන්තිකර්මයක දක්නට ලැබෙනා ගීත ඛණ්ඩ පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,
    1. D හා E
    2. A හා B
    3. B හා D
    4. A හා F
    5. D හා F

4. නාඩගම් නාටකය හා සම්බන්ධ වන ගීත ඛණ්ඩය වන්නේ,
    1. B 2. C 3. D 4. E 5. F

- නිවැරදි පිළිතුර තොරන්න.

5. නෘත්‍ය අංග පමණක් ඇතුළත් වරණය වන්නේ,
    1. මුද්‍රා නාට්‍ය,රූකඩ, ගීත නාට්‍ය , ඔපෙරා
    2. ඔපෙරා , රූකඩ,නර්තනය , නාට්‍ය
    3. මුද්‍රා නාට්‍ය,භරත නාට්‍ය,බැලේ නාට්‍ය,කථක්
    4. රූකඩ, බැලේ,ඔපෙරා,භරත නාට්‍යම්
    5. භරත නාට්‍යම්,ගීත නාට්‍ය,නර්තනය ,නාට්‍ය
6. ප්‍රොසීනියම් වේදිකාවක පසුතල දර්ශන මැවීම හා රංගාලෝකය මගින් වෙනස්කම් කිරීමට කාලය ඇගවීමට උපකාරී වනුයේ පහත තිර අතරින් කවර තිරයද?
    1. ප්‍රධාන තිරය
    2. පසුපස තිරය
    3. ගගනිකාව
    4. හරස් තිරය
    5. පැති තිරය
7. නාට්‍ය පිටපත වේදිකාවේ ප්‍රතිනිර්මාණය කිරීමේ ප්‍රධාන දායකත්වය දරනුයේ,
    1. වේදිකා පරිපාලක
    2. පෙළ මතක් කරන්නන්
    3. ආනුශාංගික ශිල්පීන්
    4. පිටපත රචකයා
    5. අධ්‍යක්ෂක
8. රංගය රිද්මයානුකූලව හෝ තාලානුකූලව අවස්ථාවට අනුව මනාව පෙළ ගැස්වීම හඳුන්වනුයේ,
    1. ප්‍රේක්ෂාව ලෙසය
    2. රංග වින්‍යාසය ලෙසය
    3. රංග විධානය ලෙසය
    4. විරාම රංගය ලෙසය
    5. කතා වින්‍යාසය ලෙසය

9. රංගනයේ යෙදෙන නළුවා රංගනයට මෙන්ම ගායනයටද විශේෂ දක්ෂතාවයක් දැක්වීම අත්‍යාවශ්‍ය වන කලා අංගය වන්නේ,
   1. බැලේ
   2. ඔපෙරා
   3. කෙටි නාට්‍ය
   4. මුද්‍රා නාට්‍ය
   5. භරත නාට්‍ය

10. මිනර්වා නාට්‍ය තුළ දක්නට නොලැබුණු ලක්ෂණයකි,
   1. තත්කාලීන සමාජය විස්තර නොකිරීම.
   2. හාස්‍ය දැනවීම සඳහා ප්‍රධාන කතාවට අමතරව අතුරු කතා යොදා ගැනීම.
   3. ජාතක කතා හා ඉතිහාස කතා පාදක වීම.
   4. නාට්‍ය තුළ විහිළු , ගීත හ ආදර කතා තිබීම.
   5. මනප්පුවා ජොසි බබා ආදී චරිත දක්නට ලැබීම.

11. සිරිත් විරිත් වල කැඩපතක් ලෙස නාට්‍ය නිර්වචනය කරනු ලැබුයේ,
   1. ඇරිස්ටෝටල්
   2. ඇලඩයිස් නිකෝල්
   3. ධනංජය පඬිතුමා
   4. විලියම් ශේක්ස්පියර්
   5. භරත මුණි පඬිතුමා

12. දේශීය නූර්ති නාට්‍ය කලාව ඇති කිරීමේ පුරෝගාමියා වනුයේ,
   1. පිලිප්පු සිංඤෝ මහතා
   2. චාල්ස් ඩයස් මහතා
   3. සී.දොන් බස්තියන් ජයවීර බණ්ඩාර මහතා
   4. ජෝන්ද සිල්වා මහතා
   5. හෙන්ද්‍රික් අප්පුහාමි මහතා

13. කෝලම් ගැමි නාටකය තුළ පූර්ව රංගයේදී එනු ලබන පාත්‍රා වර්ගයා හැදින්වෙන නාමය වන්නේ,
   1. අනාගත වක්තෘන්
   2. ස්ථාවර පාත්‍රයින්
   3. හඩ දූතයින්
   4. පණිවිඩ කෝලම
   5. පූර්ව රංගයේ නළුවන්

14. පහත සඳහන් විදුලි පහන් අතරින් නළුවා පසුපස ගමන් කරවීමට හා එක් නළුවෙක් හෝ ස්ථානයක් ඉස්මතු කර පෙන්වීමට භාවිත කරනු ලබන පහන් වර්ගය වනුයේ,
   1. ධාරා පහන්
   2. අල්ට්‍රා වයලට් ලාම්පු
   3. ස්ට්‍රොබ් පහන
   4. බැටන් ලාම්පු
   5. තිත් පහන්

- පහත දී ඇති නාට්‍ය ගී ඇසුරෙන් 16 – 20 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - රතදර සිරියා පරදන රූපෙට වටිනා
නිමල කොමළ තරුණී

B - මඬේ ලගින තාරාවන් නාවන්නද මං
ඌරු දළෙන් මොන ගජමුතු අරගන්නද මං

C - දුලා නෙතු පුලා දිසි ස්වර්ණ ලතා
සේ මෙ ළදා

D - වගුරට නරනිඳු දඹදිව පරසිඳු
හට දා වූ මම වෙමි දෙටු දූ

E - සෝබමාන දේව පුරා

F - ප්‍රේමයෙන් මන රංජිත වේ නන්දිත වේ
පුෂ්පයෙන් වන සුන්දර වේ ලංකෘත වේ

G - සෝබාව දේ මෙපුර සිරි විසිතුරු
බලනු මිතුරු මග පියකරු වූ

H - ආලේ බැන්ද මාගේ රම්‍යවන්

I - ගල් ලෙන බිඳලා ලෙන් දොර ඇරලා

15. කාලගෝල නාටකයට අයත් වන්නේ,

1. C හා H
2. Aහා E
3. B හා E
4. A හා H
5. E හා I

16. 1956 වර්ශයේ නිර්මාණය වූ නාට්‍ය ධර්මී නාට්‍යයකට අයත් වන ගීත වන්නේ,

1. A හා C
2. C හා F
3. D හා E
4. C හා D
5. E හා I

17. ලූෂන් බුලත්සිංහ මහතා අතින් නිර්මාණය වූ නාට්‍ය වල දක්නට ලැබෙනා ගීත වන්නේ,

1. A හා E
2. B හාH
3. G හාH
4. D හා E
5. B හාG

18. පිය සෙනෙහස තේමා කොටගත් නාට්‍යයක් තුළ දක්නට ලැබෙනා ගීත අයත් අක්ෂර වන්නේ,

1. D හා I
2. B හා D
3. C හා E
4. D හා F
5. E හා I

19.නූර්ති නාට්‍ය හා බැදි ගීත වන්නේ,

1. A 2. C 3. D 4. E 5. I

20.ලෝක ධර්මී ලක්ෂණ බහුලවම දක්නට ලැබෙනා නාට්‍යයකට අයත් ගී ඛණ්ඩ වනුයේ,

1. Aහා I
2. B හා I
3. G හාH
4. B හාG
5. D හා E

21.පෙරළෙන ඉරණම, කඩවුණු පොරොන්දුව යන නාට්‍ය අයත් වන්නේ,

1. නාඩගම් නාට්‍ය වලට
2. ටීටර් නාට්‍ය වලට
3. මිනර්වා නාට්‍ය වලට
4. නූර්ති නාට්‍ය වලට
5. රූකඩ නාට්‍ය වලට

22.නූර්ති නාට්‍ය කලාව පිරිහීමට බලපාන ලද කරුණකි

1. රාත්‍රී කීපයක් පුරා ප්‍රදර්ශනය කිරීම.
2. විවිධ සංස්කෘතීන්ගෙන් මිශ්‍ර කොටගත් අංග ඇතුළත් වීම.
3. නාට්‍ය රසය විසිරී යන අයුරින් අනවශ්‍ය ලෙස ජවනිකා යොදා ගැනීම.
4. අනුචිත ලෙස ගී සිංදු බහුලව යොදා ගැනීම.
5. මනා වූ නාට්‍යමය අවස්ථා මතුවන ආකාරයට පෙළ රචනා නොවීම.

23. කලාව යන සංකල්පය නිවැරදිව අර්ථකථනය වී ඇති පිළිතුර වන්නේ,

1. තම සිතුවිලි ක්‍රියාවට නැංවීමයි.
2. පුද්ගලයා වින්දනයට පත් කිරීමයි.
3. රසිකයා පිනවනු ලබන අපූර්වත්වයෙන් යුත් සෞන්දර්යාත්මක නිර්මාණයයි.
4. සොබා දහමේ අපූර්වත්වය විදහා දක්වන දර්ශනයයි.
5. පුද්ගල ප්‍රඥාව කරා යන ගමනයි.

24. වාචික අභිනය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. වාදික අභිනයට අයත් වන්නේ සංවාද පමණි.
2. නාට්‍ය ධර්මී සම්ප්‍රධායේ දර්ශන පසුතල ආදිය මවා පාන්නේ වාචික අභිනයෙනි.
3. වාචික අභිනයෙන් තොර ප්‍රාසංගික කලාවක් පැවතිය නොහැක.
4. වචෙික අභිනය උච්ඡාරණය කරනා ඉඟි පිටපතේ සඳහන් නොවේ.
5. ලෝක ධර්මී සම්ප්‍රධායේ වාචික අභිනයට වැදගත් තැනක් හිමිවේ.

25. ප්‍රාග් ඓතිහාසික කලාව මේ නමින්ද හඳුන්වයි.

1. ගැමි කලා
2. ප්‍රාකෘත කලා
3. ලලිත කලා
4. ජනප්‍රිය කලා
5. ව්‍යවහාරික කලා

26. ප්‍රාග් ඓතිහාසික කලාවට අදාළ නිවැරදි පිළිතුර වන්නේ,
    1. ප්‍රේක්ෂක විඥානය පුළුල් කරයි.
    2. ලාලිත්‍යයයෙන් හා සුබනම්‍ය බවින් යුක්තයි.
    3. අභිචාරාත්මක අරුතින් යුක්තයි.
    4. මිනිස් චින්තනය සමඟ ආත්මීය වේ.
    5. මටසිළුටු බවින් යුක්තයි.

27. දේශීය නාඩගම් නාට්‍ය කලාවේ ප්‍රථම සිංහල නාඩගම වන්නේ,
    1. හරිශ්චන්ද්‍ර නාඩගම
    2. රජතුන්කට්ටුව
    3. ඇහැළේපොළ නාඩගම
    4. ස්ථාක්කි නාඩගම
    5. දිනකර නාඩගම

28. කොළම් නාට්‍යය තුළ එන පණිවිඩ කෝළමට අයත් චරිත පමණක් දැක්වෙන වරණය වන්නේ,
    1. අණබෙර කෝළම, ජසයා,පරයා සහ නොංචි
    2. පණික්කිළේ, ආරච්චිල, වෙදරාළ සහ පරයා
    3. ලෙංචිනා , නොංචි, ගුරුහාමී සහ මුදලි
    4. අණබෙර කෝළම, නොංචි,ආඬිගුරු සහ ආරච්චිල
    5. පණික්කිලේ,ජසයා,නොංචි සහ ලෙංචිනා

29. සොකරි ගැමි නාටකයට පමණක් ආවේණික ලක්ෂණයක් වන්නේ,
    1. රාත්‍රී කාලයේ පෙන්වීම.
    2. එකම කතා පුවතක් පෙන්වීම.
    3. පිරිමි පමණක් රඟ පෑම.
    4. එළිමහන් රංග භූමියක් භාවිත කිරීම.
    5. නාට්‍ය ධර්මී ලක්ෂණ දක්නට ලැබීම.

✱ පහත දී ඇති වර්ණ අතරින් වර්ණ තුනක් එකිනෙකට සම්බන්ධ වන අතර එක් වර්ණයක් අනෙක් වර්ණ හා නොගැළපේ.නොගැළපෙන වර්ණය තෝරා එහි අංකය හිස්තැන මත යොදන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 30. | 1.ආලවක දමනය | 2. රාමා මැරීම | 3.දොරකඩ අස්න | 4.මිලින්ද ප්‍රශ්නය | 5. යුගාසන බණ |
| 31. | 1. විජය රජු | 2. රාහු අසුරේන්ද්‍රයා | 3. පඩුවස්දෙව් රජු | 4.සංඛපාල රජු | 5.කුවේණිය |
| 32. | 1.පද්මාවතී | 2.සිරිසඟ බෝ | 3. දුටු ගැමුණු | 4. ශ්‍රී වික්‍රම | 5.ඇහැළේ පොළ |
| 33. | 1. දූව | 2.පිටිපන | 3.පොකුණුවිට | 4. පේසාලේ | 5. හලාවත |
| 34. | 1. මනමේ | 2.සිංහබාහු | 3.කඳා වළළු | 4.මහාසාර | 5. ලෝමහංස |
| 35. | 1.ප්‍රොසීනියම | 2.කමත | 3.කරලිය | 4. සබය | 5.ග්‍රීක රඟමඬල |

✱ පහත දී ඇති ඡායාරූප ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


1


2


3


4


5

36. සොඳුරු ආඥාදායකයා හෙවත් නාට්‍ය අධ්‍යක්ෂක කෘතිය රචනා කරන ලද නාට්‍යකරුවා වන්නේ,

1. 1
2. 2
3. 3
4. 4
5. 5

37. ඉග් නෙව් ටා ඉ නම් සැටර් නාට්‍ය බෙරහඬ නිර්මාණය කරන ලද නාට්‍යකරු වන්නේ,

1. 1
2. 2
3. 3
4. 4
5. 5

38. දේශීය නාට්‍ය කලාවේ වේදිකා තාක්ෂණයට නව මුහුණුවරක් එක් කරමින් කැරකෙන වේදිකාව සිය නාට්‍ය සඳහා භවිත කළ නාට්‍යකරුවා වන්නේ,

1. 1
2. 2
3. 3
4. 4
5. 5

39. නාට්‍ය රචකයෙකු මෙන්ම සිංහල නව කතා රචකයෙකු ලෙස කීර්තියට පත් වූ නාට්‍ය කරුවා වන්නේ,

1. 1
2. 2
3. 3
4. 4
5. 5

40. නාට්‍ය රචනය, අධ්‍යක්ෂණය හා රංගනය යන අංශ ත්‍රිත්වයෙන්ම නාට්‍ය කලාවට දායකත්වය ලබා දුන් නාට්‍යකරුවන් දැක්වෙන වරණය වන්නේ,

1. 1 හා 5
2. 2 හා 4
3. 1 හා 3
4. 3 හා 5
5. 2 හා 5

11 පත්‍රය

✱ A හා B කොටස් දෙකින් එක් ප්‍රශ්නයක්වත් තෝරා ගෙන ප්‍රශ්න 04 ට පිළිතුරු සපයන්න.

A කොටසෙ

1) 1.සම්ප්‍රදායන් 03 ට අයත් ශාන්ති කර්ම දෙක බැගින් ලියන්න. (ලකුණු 04)
2.ඉහත ලියන ලද ශාන්ති කර්ම ඇසුරෙන් කාන්තාවන් වෙනුවෙන් කරනා ශාන්ති කර්මය නම් කර එහි දක්නට ලැබෙනා නාට්‍යමය පෙළපාළි 03 ක් ලියන්න. (ලකුණු 05)
3.ඉහත ලියන ලද නාට්‍යමය පෙළපාළි තුළ දක්නට ලැබෙනා නාට්‍යමය ලක්ෂණ උදාහරණ සහිතව විස්තර කරන්න. ( ලකුණු 06)

2) 1.සොකරි නාටකයෙහි දක්නට ලැබෙනා සංකේත හතරක් ලියන්න.

2.කෝලම් රංග ශෛලියෙහි දක්නට ලැබෙනා ලක්ෂණ හතරක් ලියන්න.

3.සොකරි හා කෝලම් නාට්‍යමය ගුණයෙන් අනූන වුවද ශාන්ති කර්ම ලක්ෂන වලින් මුළුමනින්ම බැහැර වී නොමැත.ඔබේ අදහස් දක්වන්න.

3) 1.නූතන සිංහල නාට්‍ය කලාවේ පෙරගමන් කරුවන් දෙදෙනෙකු නම් කර ඔවුන් විසින් නිර්මාණය කෙරූ නාට්‍ය දෙක බැගින් ලියන්න.

2.ඉහත ඔබ ලියන ලද නාට්‍යකරුවකුගෙන් දේශීය නාට්‍ය කලාවට සිදු වූ සේවාව අගයන්න.

3.නූතන නාට්‍ය කලාව සදහා නූර්තියෙන් ලැබූ දායකත්වය පැහැදිළි කරන්න.

B කොටස

4) 1.මූලාශ්‍රයේ දැක්වෙන කුවේණිය හා නාට්‍ය රචකයා මැවූ කුවේණිය අතර දක්නට ලැබෙනා වෙනස්කම් හතරක් ලියන්න.

2.ඉහත වෙනස්කම් දෙකක් පිළිබද නිදසුන් සහිතව විස්තර කරන්න.

3.නාට්‍යකරු කුවේණියගේ චරිත ලක්ෂණ ප්‍රකට වන ලෙස සංවාද භාවිත කර ඇති අයුරු සාකච්ඡා කරන්න.

5) 1.කුවේණි නාටකය තුළ අතීතය හා අනාගතය යා කරනා චරිතය කුමක්ද?
2.කුවේණි නාට්‍යයේ යොදාගෙන ඇති සංකේත හතරක් දක්වන්න.
3.කුවේණි වේදිකා ගත කිරීමේදී භාවිත කරන රංග උපක්‍රම උදාහරණ සහිතව ලිහන්න.

6) 1.නාට්‍ය තුළ භාවිත වන අනුෂාංගික කලාවන් හතරක් ලියන්න.

2.ඔබ කැමති අනුෂාංගික අංගයක් නිර්මාණයේදී සැලකිළිමත් විය යුතු කරුණු හතරක් ලියන්න.

3. ඔබ නැරඹූ ප්‍රසිද්ධ නාට්‍යක් තුළ ආනුෂාංගික කලාවන් භාවිත කර තිබූ ආකාරය උදාහරණ සහිතව විද්තර කරන්න.